# අපේ නිරෝගීකමට උරදෙන ස්වභාවික සම්පත

"උරුලෑවා ගිය පාර වගෙයි" යනු සිංහල ජන වහරෙහි පැවත එන ප්‍රකට කියමනකි. එනම් උරුලෑවා ජනයාට යම් ආකාරයකින් සමීප බව ඉන් හැඟ වේ. මෙවන් කියමනක් වහරට පැමිණීමට පදනම්ව ඇත්තේ උරුලෑවාගේ ශරීරයෙන් නිකුත්වන අධික ගන්ධයයි. එසේම එය ඌ ගමන් කළ මාර්ගයේ පැවතීමට තරම් ප්‍රබල තත්වයකින් යුතු වීමයි.

මෙසේ ජනවහරෙහි පමණක් නොව ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ මෙන්ම පාරම්පරික වෙදකමෙහිද උරුලෑවා යනු වැදගත් සත්වයෙකි. එනම් උරුලෑ සට්ටන් යන ඖෂධය ලබාගන්නේ උරුලෑවාගෙන් වීමයි.

උරුලෑවාගේ ශරීරයෙන් වහනය වන අධික ගන්ධය පදනම් කර ගනිමින් සංස්කෘත භාෂාවෙන් ගන්ධ මාර්ජාර ගන්ධ මාර්ජාර වියී ලෙස හඳුන්වයි. මොවුහු මැමේලියා වංශික කානිවෝරා ගෝත්‍රයේ VIVERDAE කුලයට අයත් ජීවීහුය මොවුහු බෙංගාලය මලබාරය දකුණු ආසියාව අප්‍රිකාව හා ලංකාවේ සැම පළාතක මෙන්ම දක්නට ලැබෙතිග නමුදු වර්තමානයේ තරමක් දුලබ තත්වයට පත්ව ඇති සත්ව විශේෂයකි.

ස්වභාවය -

රූපාකාරයෙන් බළලෙකු සේ දැකිය හැකි කුඩා සත්ව විශේෂයකිග ගිස පටුයග ඉතා උල්ය. කම්මුල් අළු පැහැයට හුරු සුදු පැහැතිය. ශරීරය අඟල් 22ක් පමණ දිගය. කෙටි රළු කේශරවලින් වැසී ඇත. සාමාන්‍යයෙන් ලා අළු පැහැති ශරීරයකට හිමිකම් කියයි. පිට දිග අතට ඉ රි 06 ක් පමණ වැටී ඇත. කළු පැහැති ප්‍රකට ඉරි 02ක් ගෙලෙහි දක්නට ඇත. වලිගය අඟල් 14ක් කළු පැහැති හා සුදු පැහැති මුදු 08ක් පමණ මාරුවෙන් මාරුවට පිහිටා ඇත.

කේශර -

ශරීරයේ පවතින කේශරවලට සාපේක්ෂව දිගුව පිහිටයි. සිරුරේ දිග හා සසඳන කළ ගාත් කෙටි වේ. අඟල් 04 ක් පමණ දිග හා තද කළු පැහැති වේ.

චර්යාව -

ජනගහනය අධික ප්‍රදේශවල නිශාචර වේ. කැලෑවල දිවාචර වේ. දිවා කල පඳුරක් හෝ ගොමුවක් තුළ ලැගුම් ගනී.

ආහාර -

කුඩා කුරුල්ලන්, මීයන්ල ලේනුන්, ගෙම්බන්, කාමීන් වැනි සතුන් මෙන්ම ඇතැම් පළතුරු වර්ග සමහර ශාකවල මුල්ද ආහාරයට ගනී.

අභිජනනය -

අවුරුද්දේ විශේෂ කාලයකට සීමා වී නොමැත. ගැහැණු සතා වරකට පැටවුන් 3 - 5 දක්වා ප්‍රමාණයක් බිහි කරයි. මොවුන් හීලෑ කළ හැකි අතර එවිට අවුරුදු 07 ක පමණ කාලයක් ජීවත් වේ.

උරුලෑ සට්ටන් -

උරුලෑවාගේ වෘෂණ ග්‍රන්ථිවලට ව්‍යවහාර වේ. මෙයින් නිකුත් කරන ස්‍රාවය අධික ගන්ධයකින් යුක්ත වේ. උරුලෑවා වෙතින් වහනය වන ගන්ධයෙහි ප්‍රභවය මෙය වෙයි. මිනිසාට උරුලෑ සට්ටන් ඖෂධයක් වුවද මෙම ගන්ධය සත්වයාට සොබා දහමින් දායාද කොට ඇත්තේ තම වර්ගයා හඳුනාගැනීමටය. ඖෂධීය වශයෙන් යොදා ගන්නා වෘෂණ ග්‍රන්ථියේ ස්‍රාවය කහ සුදු පැහැති මෘදු තෙල් වැනි ස්වභාවයකින් යුතුය. මී පැණි වලට වඩා ඝනත්වයෙන් යුක්තය. මෙය කස්තූරි

අභාවයෙහි දී ගැනේ.

සංග්‍රහ සංරක්ෂණ -

උරුලෑවා මරා වෘෂණ කෝෂ ගෙන රෙදි කඩෙක ඔතා දුම් වැදෙන සේ එල්ලා තැබීම සාමාන්‍ය ජනතාව විසින් කරනු ලබයි. එසේම ලබා ගත් වෘෂණ ග්‍රන්ථි පවනේ හා සූර්යාලෝකයෙන් වියළා ගැනීමත් තීක්ෂණ හා සුගන්ධවාහී බව නිසා වායු නිවාරක භාජනයක අසුරා තැබීම හෝ ඉතා තුනී රයම් පත්‍ර ඇසුරූ ලී පෙට්ටියක අසුරනු ලැබේ. උරුලෑ කෝෂ කුඩා සම් පසුබිම්වල අසුරා රෝමයන්ගෙන් ආවරණය කර තැබේ. නමුදු වාණිජමය පදනම මත කරනුයේ මෙම සතුන් කූඩුවලට ලා ඇතිකොට වරින් වර වැගිරෙන ස්‍රාවය සූරා වෙන් කොට ගැනීමයි. මෙය " ජබාදු " ලෙසද හඳුන්වයි. මෙය බෙහෙවින් සුවඳ විලවුන් නිෂ්පාදනයේදී හෝ සුගන්ධකාරකයක් ලෙසින් යොදා ගැනීමේදී කරනු ලැබේ.

ඖෂධ වේදාත්මකව -

සමහර ඖෂධ ද්‍රව්‍ය සේම මෙයද ශෝධනය කෙරේ. එනම් මිනිස් සිරුරට අහිතකර තත්ත්වයන් ඉවත් කිරිම ඉන් අපේක්ෂා කෙරේ. මෙහි මෙම වෘෂණ කෝෂ මතුපිටට ඖෂධීය සංයෝග හා කෂාය දියර මගින් වාෂ්ප ස්වේදය ලබා දේ. පසුව වෙනත් ඖෂධීය දියර මගින් සේදීමකට ලක් කෙරේ. නැවත ශාස්ත්‍රානුකූල ක්‍රියාවලියකින් අධික තාපයක්ද ලබා දීමෙන් පසු ඖෂධ සඳහා ප්‍රයෝග කෙරේ.

ඖෂධීය ගුණය ආයුර්වේදාත්මකව - -

උෂ්ණ වීර්යය බාහිරව මෙන්ම අභ්‍යන්තරවද භාවිතා කරයි. නේත්‍ර හිත වේග වීර්ය වඩයි. ශරීරයේ බලය ඇති කරයි. ශුක්‍ර වඩයි. හෘදය හා මොළයෙහි බලය වඩයි. ශ්‍රවණ ශක්තිය වඩයි. ශෝථය හා වේදනාවල ශරීර ගන්ධය, ඇදුම, කැස්ස වැනි රෝග නැති කිරීමට දායක වේ. ස්නායුගත රෝග උදර රෝග ආදියෙහිද ළදරු රත රෝගයෙහිද යෙදෙන වටිනා ඖෂධයකි.

උදා -

නයනකේතකී තෛලය

චන්ද්‍රකාන්ති තෛලය.

මෙසේ උරුලෑවා යනු ඉමහත් වූ ඖෂධීය වටිනාකමින් මෙන්ම ආර්ථිකමය වටිනාකමින් හෙබි ජීවියෙකි. එපමණක් ද නොව පාරිසරික ස්වභාවිකත්වයට අදාල චක්‍රයන් පවත්වන්නෙකි. ස්වභාව ධර්මයේ මහගු කොටස්කරුවෙකි. එනම් මේ සොබාදම් දිනිතියගෙන් සැබවින්ම අපට ලැබුණු මහගු දායාදයකි. සම්පතකි. එය සුරැකීම අප සතු වගකීමකි. යුතුකමකි.

ආශ්‍රිත ග්‍රන්ථ

ආයුර්වේද ඖෂධ සංග්‍රහය

විශ්ව ශබ්ද කෝෂය

ද්‍රව්‍ය ගුණ විඥාන - ප්‍රියව්‍රතශර්මා

ශස්තාමලකි ද්‍රව්‍යගුණවිඥාණ -

පණ්ඩිත විලියම් අල්විස්

වෛද්‍ය එන් ඩී කොඩිතුවක්කු මෙය,

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද

විද්‍යායතනය,

කැළණිය විශ්ව විද්‍යාලය,

යක්කල.